# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1993/24 - 2016 නොවැම්බර් මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2016.11.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම.

*මගේ අංකය* : RPDS/LND/09/ACQ/UDA/01.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුවිට කෝරළේ දකුණු උඩ පත්තුව සුළු කොට්ඨාසයේ, 153A නවනගරය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හිදැල්ලන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක ර. 342 මූලික පිඹුරේ කැබලි අංක 592 හා 593 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 13.4764ක් පමණ වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි දෙක වේ.

01. **කැබලි අංක 592**

ඉඩමේ නම: එරියගහදෙනියෙකුඹුර, කණුකැටියෙකුඹුර, කණුකැටියෙගොඩැල්ල, පාම්ගාර්ඩන් වත්ත; ඉඩමේ විස්තරය: අත්හරින ලද කුඹුර; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: සී/ස. බලංගොඩ වැවිලි සමාගම, තැ. පෙ. 06, ෆාම්ගාර්ඩ්නර්, රත්නපුර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07; ප්‍රමාණය: හෙක්. 2.1466.

02. **කැබලි අංක 593**

ඉඩමේ නම: පාම්ගාර්ඩන් වත්ත, එරියගහදෙනියෙකුඹුර, කණුකැටියෙකුඹුර; ඉඩමේ විස්තරය: වත්ත, අවුරුදු 8-10 වයසැති රබර් වගාවක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: සී/ස. බලංගොඩ වැවිලි සමාගම, තැ. පෙ. 06, ෆාම්ගාර්ඩ්නර්, රත්නපුර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07; ප්‍රමාණය: හෙක්. 11.3298

ඉහත සඳහන් ඉඩමට / පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2016 දෙසැම්බර් මස 28 වෙනි දින පෙ. ව. 10.00 ට රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2016 දෙසැම්බර් මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

සී. එම්. කෝට්ටවත්ත,
ප්‍රාදේශීය ලේකම්,
රත්නපුර.

2016 නොවැම්බර් මස 10 වැනි දින,
රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-124


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*



1A - G 24568 – 17 (2016/11)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.